දිනමිණ

# ලංසු සඳහා ආරාධනයයි

# ශ්‍රී ලංකා දුම්රිය සේවය

## ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙත III වන පංතියේ හිස් මගී ප්‍රවේශ පත්‍ර 50,000,000 ක් ප්‍රසම්පාදනය

### ප්‍රසම්පාදන අංකය : SRS F. 7893

01. කොළඹ ශ්‍රී ලංකා දුම්රිය සේවයේ, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන (ප්‍රධාන) කමිටුවේ සභාපති විසින් ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙත III වන පන්තියේ හිස් මගී ප්‍රවේශපත් 50,000,000 ක් සැපයීම සඳහා යෝග්‍යතා පූර්ණ සුදුසුකම් ලත් සැපයුම් කරුවන් වෙතින් මුද්‍ර, තැබූ ලංසු කැඳවනු ලැබේ. ලංසු කරුවන් තම ලංසු ඍජුව හෝ නෛතික ඇටෝර්නි බලපත්‍රයක් මගින් බල ගැන්වූ ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි බලය පැවරූ නියෝජිතයකු මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

02. ලංසුකරණය ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රියාපටිපාටිය මගින් මෙහෙයවනු ලැබේ.

03. යෝග්‍යතාපූර්ණ අභිලාෂී ලංසුකරුවන්ට 2023.02.10 දින සිට 2023.03.27 දින තෙක් පැය 9.00 සිට පැය 15.00 දක්වා කාර්යාල දිනයන්හිදී පහත ලිපිනයෙන් වැඩිමනත් තොරතුරු ලබාගැනීමටත්, ලංසු ලිපිලේඛන පරීක්ෂා කර බැලීමටත් පිළිවන.

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන),**
**දුම්රිය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුව,**
**ඕල්කොට් මාවත, කොළඹ - 10, ශ්‍රී ලංකාව.**

| | | |
|---|---|---|
| **දුරකථන අංක** | : | **94 (11) 2438078 හෝ 94 (11) 2436818** |
| **ෆැක්ස් අංකය** | : | **94 (11) 2432044** |
| **ඊමේල්** | : | **srs.slr@gmail.com** |
| **වෙබ් අඩවිය** | : | **www.railway.gov.lk** |

04. මෙම ලංසුකරණ ලියවිල්ලෙහි දැක්වෙන පිරිවිතරයන්හි සඳහන් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව පසුගිය වසර පහ තුළ ඉහත අයිතම හෝ සමාන අයිතම සංවිධාන වලට සැපයීම පිළිබඳ පෙර වාර්තා, සැපයූ භාණ්ඩ පිළිබඳ කාර්යසාධන සහතික සමග, ඉහත අයිතම සැපයීම සඳහා හැකියාව හා සාමාර්ථ්‍යය තමන් සතු බවට ලේඛනමය සාක්ෂි ලංසු කරුවන් විසින් ඉදිරිපත් කළ යුතුය. භාණ්ඩ සපයන ලද ආයතන වල පසුගිය සැපයුම් වාර්තා පැහැදිලි කළ යුතු අතර, අදාළ සියලුම ලිපි ලේඛනවල ඡායා පිටපත් පැහැදිලිව හා පහසුවෙන් කියවිය හැකි විය යුතුය.

05. කොළඹ 10, ඕල්කොට් මාවත, දුම්රිය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුවේ, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන) ලිපිනයට ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් හා ආපසු නොගෙවන රු. 31,000/- ක හෝ පහසුවෙන් මාරුකරගත හැකි මුදල් වර්ගයකින් සමාන මුදලක් ගෙවීමෙන් අනතුරුව 2023.02.10 දින සිට 2023.03.27 දින පැය 15.00 තෙක් අභිලාෂී ලංසුකරුවන්ට ඉංග්‍රීසි බසින් වන ලංසුකරණ ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් ඉහත ලිපිනයෙන් හෝ 2023.03.27 දින ශ්‍රී ලංකා වේලාවෙන් 15.00 පැය තෙක් ශ්‍රී ලංකා විදේශ දූත කාර්යාල වෙතින් ලබාගත හැකිය.

06. සියලුම ලංසු සමග ශ්‍රී ලංකා මහ බැංකුව මගින් අනුමත ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන බැංකුවකින් නිකුත් කළ රු. 1,850,000.00 ක කොන්දේසි විරහිත ආකාරයේ ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කළ යුතුය.

07. ලංසු 2023.03.28 දින 14.00 පැයට හෝ ඊට පෙර පහත ලිපිනයට ගෙනැවිත් භාර දිය යුතු අතර ලංසු භාරගැනීම අවසන් වූ වහාම ලංසු විවෘත කරනු ලැබේ. ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට එම අවස්ථාවට සහභාගි වන මෙන් ඉල්ලා සිටිනු ලැබේ. ප්‍රමාද ලංසු භාර නොගැනේ.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන (ප්‍රධාන) කමිටුව,**
**ශ්‍රී ලංකා දුම්රිය සේවය,**
**ඕල්කොට් මාවත, කොළඹ - 10.**
**ශ්‍රී ලංකාව.**

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන (ප්‍රධාන) කමිටුව,**
**ශ්‍රී ලංකා දුම්රිය සේවය.**

**යොමු අංක : SRS/F. 7893**